1978 - 8 - 10

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 33 දරන සංස්ථා නීතිඥ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 අගෝස්තු මස 04 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල: ශත 45 යි    තැපැල් ගාස්තුව: ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 33 දරන සංස්ථා නීතිඥ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 68/77.

**රාජ්‍ය සංස්ථාවලට සහ පළාත් පාලන ආයතනවලට නීතිඥවරයන්ගේ සේවා සැපයීමේ කාර්යය සඳහා සංස්ථා නීතිඥ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 33 දරන සංස්ථා නීතිඥ ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)*

**2.** (1) සංස්ථා නීතිඥ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. *(සංස්ථා නීතිඥ ආයතනය පිහිටුවීම.)*

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් ද, පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය. තව ද එකී නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**3.** රාජ්‍ය සංස්ථාවලට සහ පළාත් පාලන ආයතනවලට— *(ආයතනයේ පරමාර්ථ)*

(අ) නීති උපදෙස් දීම ;

(ආ) යම් විනිශ්චය අධිකාරයක් හෝ අර්ධ විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් මණ්ඩලයක් හෝ නැනැත්තකු ඉදිරියේ ඒ සංස්ථා සහ පළාත් පාලන ආයතන සඳහා සහ වෙනුවෙන් පෙනී සිටීම, උත්තරවාද ඉදිරිපත් කිරීම හෝ ක්‍රියා කිරීම ;

(ඇ) යම් නෛතික කාරණයක් සම්බන්ධයෙන් හෝ පිළිබඳව සාමාන්‍යයෙන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව එවැනි යම් සංස්ථාවක් හෝ ආයතනයක් සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කිරීම

සඳහා නීතිඥවරයන්ගේ සේවා සැලසීම ආයතනයේ පරමාර්ථ විය යුතු ය.

**4.** ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ආයතනයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :— *(ආයතනයේ බලතල.)*

(අ) ආයතනය විසින් සලසන ලද හෝ සපයන ලද සේවා සඳහා මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගාස්තු අය කිරීම ;

2—ඒ 34736—11,530 (78/06)

(ආ) අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට කෙළින් ම හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු නැතහොත් අනුයෝජිතයකු මගින් ඇතුළත්වීම සහ ඒ ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම ;

(ඇ) නියම කරනු ලැබිය හැකි නියමවලට හා කොන්දේසිවලට යටත්ව ආයතනයේ නීති කාර්ය මණ්ඩලයේ සාමාජික යන් නීතියේ විශේෂ ක්ෂේත්‍රවල සහ අනුයාත විෂයයන්හි පුහුණු කිරීම හෝ පුහුණු කිරීම සඳහා විධිවිධාන සැලැස් වීම ;

(ඈ) යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඉ) අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කර ගැනීම ;

(ඊ) යම් කාරණයක් හෝ නඩු කටයුත්තක් සඳහා හෝ සම්බන්ධ යෙන් නීතිඥවරයන්ගේ සේවාවන් යොදා ගැනීම ;

(උ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඌ) ආයතනයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ හෝ හිතකර වූ හෝ ඊට ආනුෂංගික වූ වෙනත් සියලු දේ කිරීම.

ආයතනයේ කළමණාකාර මණ්ඩලය.

5. (1) ආයතනයේ කටයුතු සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමණාකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය. ඒ සියලු ම සාමාජිකයන් අමාත්‍යවරයාගේ නිර්දේශය පිට, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන, අවුරුදු දහයකට නොඅඩු පළපුරුද්ද ඇති නීතිඥවරයන් විය යුතු ය. ඒ සාමාජිකයන් තත්ත්වයෙහි ලා හා පිළිගැනීමෙහි ලා සමාන විය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතිය ද නැතහොත් යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් අක්‍රමිකතාවක් පැවතිය ද මණ්ඩලයේ සාමාජිකයන්ට ක්‍රියා කළ හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ කවරකු විසින් ද යන වග.

6. මණ්ඩලයේ රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයකු තෝරා පත් කර ගත යුතු ය.

මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය හා කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම.

7. මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය. මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් ස්වකීය කාර්ය පටිපාටිය මේ පනතේ අනෙක් විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින්, විධිමත් කර ගනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන් පූර්ණකාලීන නිලධරයන් විය යුතු බව සහ ඔවුනට පාරිශ්‍රමික ගෙවිය යුතු බව.

8. මණ්ඩලයේ සාමාජිකයන්, එබඳු සාමාජිකයන් වශයෙන් වූ ස්වකීය කාර්යයන්ට අමතරව, ආයතනයේ කාර්යක්ෂම පරිපාලනය සම්බන්ධයෙන් සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතු එහි පූර්ණ කාලීන නිලධරයන් විය යුතු අතර, මුදල් විෂයය භාර අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයන් අනුව පාරිශ්‍රමික, ආයතනයේ අරමුදල්වලින් ඔවුනට ගෙවනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත විධාන දිය හැකි බව.

9. ස්වකීය බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී, මණ්ඩලය අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු අතර මණ්ඩලය ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

ආයතනයේ සේවා නියුක්තයෝ.

10. (1) මණ්ඩලයේ කටයුතු නිසි ලෙස හා කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන නිලධර යන් හා සේවකයන් සංඛ්‍යාවකින් ආයතනයේ සේවා නියුක්ත යන් සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් ආයතනයේ සියලු සේවා නියුක්තයන් පත් කළ යුතු ය:

එසේ වුව ද ආයතනයේ නීති කාර්ය මණ්ඩලය නොවන කාර්ය මණ්ඩලය පත් කරනු ලබන විටෙක, අමාත්‍යවරයා විසින් මණ්ඩලය අමතා යවනු ලබන ලියවිල්ලක් මගින්, අමාත්‍යවරයාගේ එකඟත් වය ලබා ගැනීමේ අවශ්‍යතාව අත් හරිනු ලැබිය හැකි ය.

ආයතනයේ නීති කාර්ය මණ්ඩලය.

11. මණ්ඩලයේ සියලු සාමාජිකයන්ගෙන් සහ නීතිඥවරයන් වන ආයතනයේ වෙනත් සේවා නියුක්තයන්ගෙන් ආයතනයේ නීති කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

12. (1) ආයතනයේ ඉල්ලීම පිට, යම් රාජ්‍ය නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩල යට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් යම් තැනැත්තකු ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වී සිටින අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල සේවා නියුක්තයන් ආයතනය විසින් සේවයෙහි නියුක්ත කර ගත හැකි බව.

13. නීතිඥවරයන් වන්නා වූ ද ආයතනයේ සේවයෙහි නියුක්ත කර ගැනීම සඳහා සුදුසු යයි සලකනු ලබන්නා වූ ද, රාජ්‍ය සංස්ථාවල සේවා නියුක්තයන්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත, ආයතනය විසින් ආයතනයේ නීති කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

සේවා නියුක්තයන් පිළිබඳ විනය පාලනය.

14. 12 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ සේවා නියුක්තයන් නොවන, ආයතනයේ අනෙක් සේවා නියුක්තයන් පිළිබඳ විනය පාලනය, අමාත්‍යවරයාගේ නිර්දේශය ලැබීමෙන් පසු, මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් ආදීන්ට අධිකරණයෙහි පෙනී සිටීමට හිමිකම් ඇති බව.

15. මණ්ඩලයේ සෑම සාමාජිකයකුට ම සහ ආයතනය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලබන නීතිඥවරයකු වන අනෙක් සෑම නිලධරයකුට ම එබඳු නීතිඥවරයකු වශයෙන් වූ ස්වකීය තත්ත්වයෙන් සහ එම තත්ත්වයෙන් පමණක්, යම් රාජ්‍ය සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක උපදෙස් පිට—

(අ) ඒ රාජ්‍ය සංස්ථාව හෝ පළාත් පාලන ආයතනය ; හෝ

(ආ) යම් සේවා නියුක්තයකු විසින් ඒ රාජ්‍ය සංස්ථාව හෝ පළාත් පාලන ආයතනය සඳහා හෝ වෙනුවෙන් කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ සේවා නියුක්තයා විසින් හෝ ඒ සේවා නියුක්තයාට විරුද්ධව හෝ පවරන ලද යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී ඒ සංස්ථාවේ හෝ පළාත් පාලන ආයතනයේ ඒ සේවා නියුක්තයා ; හෝ

(ඇ) සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත නොකරනු ලැබූ යම් තැනැත්තකු හෝ මණ්ඩලයක් නියෝජනය කිරීමට හෝ ඒ තැනැත්තා හෝ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට හෝ එහි විත්තිවාචකය භාර ගැනීමට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට යම් ලිඛිත නීතියක් හෝ ගිවිසුමක් මගින් හිමිකම් ඇති අවස්ථාවක, ඒ තැනැත්තා හෝ මණ්ඩලය

සඳහා හෝ වෙනුවෙන් යම් අධිකරණයකදී, විනිශ්චය අධිකාරයක දී හෝ යුක්තිය පසිඳලීම සඳහා නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් ආයතනයක දී සහ වෙනත් යම් මණ්ඩලයක් හෝ තැනැත්තකු ඉදිරියේ දී පෙනී සිටීමට, උත්තරවාද ඉදිරිපත් කිරීමට හෝ ක්‍රියා කිරීමට හිමිකම් තිබිය යුතු ය.

ආයතනය විසින් සේවයෙහි නියුක්ත කර නොමැති නීතිඥවරයන් මණ්ඩලය විසින් සේවයේ යෙදවිය හැකි බව.

16. (1) රාජ්‍ය සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක උපදෙස් අනුව හෝ විශේෂ අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන විටක හෝ සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට හෝ එහි යම් සේවා නියුක්තයකුට හෝ 15(ඇ) වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකුට හෝ මණ්ඩලයකට උපදෙස් දීම සඳහා නැතහොත් යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ යුක්තිය පසිඳලීම සඳහා නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක් ඉදිරියේ හෝ වෙනත් යම් මණ්ඩලයක් හෝ තැනැත්තකු ඉදිරියේ ඒ රාජ්‍ය සංස්ථාව හෝ පළාත් පාලන ආයතනය හෝ එහි යම් සේවා නියුක්තයකු හෝ 15(ඇ) වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු හෝ මණ්ඩලයක් නියෝජනය කිරීම සඳහා ආයතනයේ මණ්ඩලයෙහි යම් නීතිඥවරයකු නොවන හෝ ආයතනය විසින් සේවයේ නියුක්ත කර නොමැති සහ රාජ්‍ය නිලධරයකු නොවන යම් නීතිඥවරයකුගේ හෝ ශ්‍රී ලංකාවේ දී හෝ පිටරට දී යම් විදේශීය නීතිඥවරයකුගේ උපදෙස් ලබා ගැනීම හෝ සේවය ලබා ගැනීම කළ හැකි ය.

(2) යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් හෝ වෙනත් මණ්ඩලයක් හෝ තැනැත්තකු ඉදිරියෙහි පෙනී සිටීමට යම් විදේශීය නීතිඥවරයකුට ඇති අයිතිවාසිකම ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය හෝ වෙනත් අධිකරණ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ කථා කිරීමේ අයිතිය තත් කාලයෙහි පාලනය කරන යම් නීතියකට, නියෝගයකට හෝ පරිචයකට අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය.

ආයතනයේ නීති කාර්ය මණ්ඩලය ආදින්ට යම් අධිකරණයනාදියක කථා කිරීමේ අයිතිය තිබිය යුතු බව.

17. ආයතනයේ නීති කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුට ම හෝ 16 වන වගන්තිය යටතේ ආයතනය විසින් සේවාවක් යොදා ගනු ලබන යම් නීතිඥවරයකුට යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් හෝ වෙනත් මණ්ඩලයක් හෝ තැනැත්තකු ඉදිරියේ වෙනත් යම් නීතිඥවරයකු භුක්ති විඳින කථා කිරීමේ අයිතිය ම තිබිය යුතු නමුත් යම් නිල පදවි නාමයක හේතුවෙන් හෝ ආයතනය විසින් ඔහු සේවයෙහි නියුක්ත කර ගනු ලැබීමේ හේතුවෙන් යම් වැඩිදුර අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ඔහුට නොතිබිය යුතු ය; තවද යම් නිල කාර්යයන් සඳහා ඒ සාමාජිකයාට හෝ නීතිඥවරයාට දෙනු ලැබූ යම් නිල පදවි නාමයක් එම අධිකරණයට, විනිශ්චය අධිකාරයට හෝ ආයතනයකට හෝ වෙනත් මණ්ඩලයකට හෝ තැනැත්තකුට නිවේදනය කිරීම හෝ එහි නඩු කටයුතුවල දී වාර්තාගත කිරීම හෝ නොකළ යුතු ය.

ආයතනයේ ප්‍රාග්ධනය.

18. (1) ආයතනයේ මූලික ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂයක් විය යුතු ය. එම ප්‍රාග්ධනය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත ඒකාබද්ධ අරමුදලින් ආණ්ඩුව විසින් දෙනු ලබන ප්‍රදානවලින් සහ ලබා ගැනීමට සලස්වන ණයවලින් ද ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් භාර අමාත්‍යවරයාගේ නියමයකින් හෝ කැමැත්ත ඇතිව ඒ දෙපාර්තමේන්තුව විසින් ආයතනය වෙත පවරනු ලබන යම් දේපළක වටිනාකමින් ද සමන්විත විය යුතු ය.

(2) විසර්ජන පනතක් මගින් හෝ ජාතික රාජ්‍ය සභාවේ යෝජනා සම්මතයකින් හෝ අවසර දෙනු ලබන ප්‍රමාණයකින් ආයතනයේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කරනු ලැබිය හැකි අතර එම මුදල් ප්‍රමාණය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත, ප්‍රදාන වශයෙන් හෝ ණය වශයෙන් ආණ්ඩුව විසින් ආයතනයට ගෙවිය යුතු ය; නැතහොත් ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

ආයතනය විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු.

19. (1) ආයතනය විසින් සලසනු ලබන නියමිත සේවාවන් සඳහා ආයතනය විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු, මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින් කරනු ලබන හා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් නියම කරනු ලැබිය යුතු අතර එවැනි ම නියමයකින්, ඒ ගාස්තු කලින් කල ප්‍රතිශෝධනය කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) නියමිත සේවාවන් නොවන සේවාවන් සඳහා ආයතනය විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු, ආයතනය විසින් ඒ සඳහා බලය දෙනු ලබූ නිලධරයකු විසින් නියම කළ යුතු අතර ඒ නිලධරයා විසින් ඒ ගාස්තු කලින් කල ප්‍රතිශෝධනය කළ හැකි ය.

1971 අංක 38 දරන මුදල් පනතෙහි විධිවිධාන අදාළ කිරීම.

20. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ මුදල් පාලනය හා ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

21. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මේ පනත යටතේ පවරනු ලබන නඩුවල දී ආයතනය ආරක්ෂා කිරීම.

22. මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියෙන් සලසා ඇති ආරක්ෂාව ඒ ආයතනය විසින් හෝ මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කරන අතරතුර යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ නීතිඥවරයකු වශයෙන් වෙනත් යම් තත්ත්වයකින් යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ කරන ලද යම් නොසැලකිලිමත් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ආයතනයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

23. ආයතනයේ සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනය අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

24. ආයතනය අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කළ යුතු ය.

නියෝග.

25. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා ද, නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො මැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුලු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"රාජ්‍ය නිලධරයා" යන්නට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව යටතේ හෝ සේවයෙහි නියුක්ත කර ඇති යම් නිලධරයකු හෝ සේවකයකු ඇතුලත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත නොවන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් සපයනු ලබන්නා වූ මුළු ප්‍රාග්ධනය හෝ ඉන් කොටසක් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ලබන්නා වූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වේ; තව ද

"විදේශීය නීතිඥවරයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන හෝ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නීතිඥවරයකු නොවන හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නීතිඥවරයකු නොවන යථා පරිදි සුදුසුකම් ලත් නීතිඥවරයකු අදහස් වේ.